ක්‍රියාකාරකම: 1.1.3- විවිධ සත්ත්ව ඉරියව් රේඛාවෙන් අඳිමු.

ඉගෙනුම් ඵල:

- ස්වාභාවික පරිසරයේ අලංකාරය රස විඳියි.
- පරිසරයට ආදරය කරයි.
- සතුන්ගේ හැඩතල, ගති ලක්ෂණ ස්වාභාවිකව නිරීක්ෂණය කරයි.

උපදෙස්:

- දුවේ පුතේ රේඛා චිත්‍රයක් වර්ණ කරන්නේ නැහැ.
- චිත්‍ර ඇඳීමට පැන්සල, පෑන, පැස්ටල් කූරක් හෝ වෙනත් තමන් කැමති දෙයක් භාවිතා කිරීමට හැක.
- ඉතින් අද අපි සත්ත්ව ඉරියව් කිහිපයක් අඳිමු.
- දූලා පුතාලගෙ ගෙවත්තෙ වටපිටාවෙ නිතර දකින සතුන් කිහිපයක් අඳිමු. පොත්පත්වල පින්තූරත් බලන්න.
- සෙවණැල්ල වැටෙන පැත්ත අඳුරු කරන්න.
- අඳුරු කිරීමට වර්ණ භාවිතා කරන්න එපා.
- ඔබ ඇඳීමට භාවිතා කරන පැන්සල, පෑන භාවිතා කරමින් එළිය අඳුර දක්වන්න.
- අවම වශයෙන් සත්ත්ව රූප 5ක් වත් අඳින්න.

උදා: පහත පින්තූර බලන්න.